11. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් පෙනී ගිය හොත් එයින් නුසුදුස්සකු වීමටත් තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

07 - 422

---

**රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා
කඩඉම් විභාගය - 2017(I)2018

2017.06.21 වැනි දින හා අංක 2024/35 දරන ශ්‍රී ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 04 වන පරිශිෂ්ටයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 නොවැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම නිවේදනයට අනුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්කළ හැක්කේ රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ට පමණි.

**සටහන** - මෙම ගැසට් නිවේදනයට සමගාමීව පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා මගින් ද අනෙකුත් අදාළ ආයතනවල අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන එම ආයතන මගින් ද නිකුත් කරනු ඇත.

ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම් කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන්කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව *ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ.* එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

02. (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනය ආරම්භයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවම්වලට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, නිවැරදිව හා පැහැදිලිව පිළියෙළ කළ අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2018 අගෝස්තු මස 13 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සහ ශ්‍රේණිය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

04. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
ii වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

05. අයදුම්පත්‍ර.- ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 5.0 තෙක් ඡේද පළමුවන පිටුවට ද, 6.0 සට 9.0 තෙක් ඡේද දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙළ කර ගත හැකි වුවද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කර අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කර ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(I)2018" යන්න සඳහන් කරන්න.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.- ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

පළමුවන වරට මෙම විභාගයට ඉල්ලුම් කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම්, රු. 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-12-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තු වලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර අදාළ පිරිදි විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර, ඊට අදාළ ලදුපත සමග නියමිත දිනට හෝ ඊට පෙර එවා ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත අත්සන් සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාග යට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග, ෆැක්ස් මගින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර, විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරු තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

07. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

08. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

09. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අපේක්ෂකයන් අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකටම පිළිතුරු සැපයිය යුතු වේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු නිලධාරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුය. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරින්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතුවේ.

12. විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන අතර අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

13. විභාග පරිපාටිය - විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් යුක්තය.

01. විෂය අංක 03 - සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම - (ලකුණු 100 යි)

- I කොටස - සාමාන්‍ය පරිපාලනය - කාලය පැය 1 1/2 යි (ලකුණු 50 යි)

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ මූලික දැනුම
(ආ) ආයතන සංග්‍රහයේ VI සිට VIII, XII, XIV, XXIV, XXVII, XXVIII පරිච්ඡේද ඇතුළත් වේ.
(ඇ) 1973 අංක 48 දරන රාජ්‍ය ලේඛනාරක්ෂක පනත හා 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක පනත (සංශෝධන)
(ඈ) 1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු තාක්ෂණ සංවර්ධන පනතේ III කොටස
(ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත
(ඊ) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

- II කොටස - මූල්‍ය ක්‍රම - කාලය පැය 1 1/2 යි (ලකුණු 50 යි)

(උ) මුදල් රෙගුලාසි - පුස්තකාල මඟින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාල රෙගුලාසි

02. විෂය අංක 04 - පුස්තකාල සංවිධානය - කාලය පැය 03යි - (ලකුණු 100 යි)

(අ) පුස්තකාල ගොඩනැගිලි හා උපකරණ
(ආ) රජයේ ප්‍රකාශනවල ප්‍රයෝජන හා භාවිතා කරන අයුරු
(ඇ) පුස්තකාල ක්ෂේත්‍රයේ කලාපීය හා අන්තර්ජාතික සංවිධාන
(ඈ) පුස්තකාල කළමනාකරණයේ ක්‍රමෝපායන්
(ඉ) මූල්‍ය කළමනාකරණය
(ඊ) කාල කළමනාකරණය
(උ) මානව සම්පත් කළමනාකරණය
(ඌ) ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු
(එ) පුස්තකාල පරිගණකකරණය පද්ධති හා ජාල

සැ.යු.- මෙම පරීක්ෂණයෙන් සමත් වීම සඳහා එක් එක් විෂයය සඳහා වූ ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතු වේ.

14. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

15. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2018 ජුනි මස 29 වැනි දින,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(I) 2018**

**Efficiency Bar Examination for Officers in Grade II of the Sri Lanka Government Librarians' Service - 2017(I)2018**

ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනයේ පළමු ඡේදයේ සටහන බලන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :
2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ බව :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| විෂයය | විෂයය අංකය |
|---|---|
| | |
| | |

5.0 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

6.0 දුනට දරන තනතුර :
6.1 තනතුර :————.
62 පත්වීම් ලිපියේ අංකය :————.

7.0 7.1 ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවටද? :————.
7.2 එසේ නොවන්නේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
7.3 තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
7.4 ලදුපත් අංකය :————.
7.5 දිනය :————.

ලදුපත නොගැළවෙන සේ අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරියෙකු/නිලධාරිනියක බව ද,
(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,
(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාල සීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,
(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,
(v) නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද (අදාළ නොවේ නම් කපා හරින්න.) මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

07 - 392

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

ශ්‍රී ලංකා දුම්රිය සේවයට, දුම්රිය එන්ජින් පණ ගැන්වීම සඳහා අවශ්‍ය 12V, 215 Ah, 20 Hr ශ්‍රේණිගත ඊයම් අම්ල බැටරි 500ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7567

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රදන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට, දුම්රිය එන්ජින් පළ ගැන්වීම සඳහා අවශ්‍ය 12V, 215 Ah, 20 Hr ශ්‍රේණිගත, ඊයම් අම්ල බැටරි 500 ක සංඛ්‍යාවක් මිලයට ගැනීම සඳහා වන ප්‍රසම්පාදන අරභයා, නිෂ්පාදකයින් සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට ස්වකීය ඇටර්නි බලය මගින් බලය පවරන ලද බලයලත්/වරලත් ඒජන්තවරුන් මාර්ගයෙන් හෝ සෘජුවම හෝ සිය ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාරගැනීම 2018.07.31 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

03. ලංසු ආපසු ගෙවනු නොලබන රුපියල් 6,500 ක් වන සේ පහසුවෙන් පරිවර්ථනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමින් යුත් ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2018.07.30 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශයක ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් වෙතින් ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, දුම්රිය ගඩබා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිවන අතර, වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කරුණාකර විමසන්න.

දුරකථන : 94(11)2438078/2436818
ෆැක්ස් අංකය : 94 (11)2432044
ඊමේල් :srs.slr@gmail.com
වෙබ් අඩවිය :www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රසම්පාදන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7567

07-286

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන නිවේදනය

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා Rail Joint Shims යුගල 5700 ක් ප්‍රසම්පාදනය කිරීම

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7577

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා Rail Joint Shims යුගල 5700ක් ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් එම භාණ්ඩ නිෂ්පාදකවරුන්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන් සිය ලංසු සෘජුවම හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඇටර්නි බලය පැවරූ බලයලත් ඒජන්තවරු මගින් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

02. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතෙහි පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩල වලින් ලබාගත හැකි ආකෘති මගින් පමණක්, ශ්‍රී ලංකා රු. 4,000 ක ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තුවක් හෝ පහසුවෙන් රුපියල් වලට හැරවිය හැකි ඒ හා සමාන මුදල් වර්ගයකින් ගෙවීම් කිරීමෙන් පසුව 2018.07.31 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 දක්වා ලංසුපත් මිලදී ගත හැකි ය.

03. 2018.08.01 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

04. මෙම භාණ්ඩ (Rail Joint Shims) ISO 9001 : 2008 සහතික කරන ආයතන පිළිගත් හෝ සැපයුම්ලාභියාට පිළිගත හැකි ඒ හා සමාන ජාත්‍යන්තර තත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතියෙන් යුත් ඒවා විය යුතු ය.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකා දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට සහභාගි වන මෙන් ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. විධිමත්ව සම්පූර්ණ කර මුද්‍රා තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නොඑසේ නම් ගෙනවිත් භාරදිය යුතු ය :

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,<br>
ඕල්කොට් මාවත,<br>
කොළඹ 10.

07. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලේඛන ගාස්තු ගෙවීමෙන් තොරව පරීක්ෂා කර බැලිය හැක.

දුරකතන අංක : 2438078/2436818<br>
ෆැක්ස් අංකය : 2432044<br>
විද්‍යුත් තැපැල :srs.slr@gmail.com<br>
වෙබ් අඩවිය :www.railway.gov.lk

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7577

07-438

## බඩු බාහිරාදිය විකිණීම්

### මහෙස්ත්‍රාත් අධිකරණය - කුලියාපිටිය

මෙම අධිකරණය ඉදිරියේ පැවති නඩුවලට අදාළව රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද, අධිකරණ ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද සහ 2015, 2016 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙන් වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.08.04 වැනි දින පෙ.ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටීනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ.ව. 9.45 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබාගෙන භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

07. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ එදින ප.ව. 03.30ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය.

ඩී. එම්. රුවන් ධම්මික දිසානායක,<br>
මහෙස්ත්‍රාත්,<br>
කුලියාපිටිය.

2018 ජුනි මස 28 වැනි දින,<br>
කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### 2018 වර්ෂයේ වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ ලේඛනය

| අනු. අංකය | නඩු අංකය | අදාළ අයිතමය පිළිබඳ විස්තර |
|---|---|---|
| 01 | 31784 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය සහ ලිප |
| 02 | 31288 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය සහ ලිප |
| 03 | 30976 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය සහ ලිප |
| 04 | 30337 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය සහ ලිප |
| 05 | 30557 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය |
| 06 | 28986 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර 2 සහ වතුර මෝටරය |
| 07 | 28140 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර 5 සහ ලිප |
| 08 | 27019 | 12.5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩරය |
| 09 | 26641 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 10 | 26370 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 11 | 26184 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 12 | 25894 | ගෑස් ලිප් 01 |
| 13 | 25350 | විදුලි පැස්සුම් උපකරණය |
| 14 | 25346 | විදුලි පන්දම |
| 15 | 25382 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 16 | 25281 | ගෑස් සිලින්ඩර් 09 ගෑස් ලිප් 01 |
| 17 | 25127 | ගෑස් ලිප් 01 |
| 18 | 25077 | ගෑස් ලිප් 01 |
| 19 | 24917 | ගෑස් ලිප් 01 |
| 20 | 24318 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 02 |
| 21 | 24228 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 22 | 23852 | 5 කි.ග්‍රෑ. ගෑස් සිලින්ර් 01 ගෑස් ලිප් 01 |
| 23 | 23785 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 24 | 23771 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 25 | 23765 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 26 | 23764 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 27 | 23477 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 28 | 34612 | කහපාට කුඩා ගෑස් සිලින්ඩරය සහ ලිප ඇළුමිනියම් මුට්ටි 02 |
| 29 | 35243 | ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 30 | 35241 | නිල්පාට ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 31 | 35240 | ගෑස් ලිප් 01 |
| 32 | 35701 | ලිට්රෝ 12.7 කි.ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01 ලිට්රෝ 8.5 කි. ග්‍රෑ. ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 02 |
| 33 | 36655 | නිල්පාට 12.5 ගෑස් සිලින්ඩර් 01 ගෑස් ලිප් 01 |
| 34 | 37442 | කෑම පෙට්ටිය |
| 35 | 37447 | දුරකතන චාජරය |
| 36 | 37451 | රෙදි මීටරයක් |
| 37 | 35837 | බවුත් 01 |
| 38 | 37433 | ළමා පාවහන් යුගලය |
| 39 | 37441 | රෙදි යාරයක් |
| 40 | 37427 | දුරකතන චාජරය |
| 41 | 22592 | කාන්තා අත් ඔරලෝසුව |
| 42 | 35840 | දුරකතන චාජරය |
| 43 | 25179 | දුරකතන චාජරය |
| 44 | 35838 | රිචාජබල් විදුලි පන්දම |
| 45 | 25672 | දුරකතන චාජරය |
| 46 | 25348 | ජල කරාමයක් |
| 47 | 33528 | රිචාජබල් විදුලි පන්දම |
| 48 | 34163 | ඝනක යන්ත්‍රය |
| 49 | 34160 | ජල කරාමයක් |
| 50 | 25678 | ඝනක යන්ත්‍රයක් |
| 51 | 22606 | විදුලි පෑස්සුම් උපකරණය |
| 52 | 25350 | කොන්ඩා සැකසුම් උපකරණය |
| 53 | 35849 | කාන්තා අත් බෑගයක් |
| 54 | 35833 | රෙදි යාරයක් |
| 55 | 37438 | රෙදි යාරයක් |
| 56 | 25653 | රිචාජබල් විදුලි පන්දම |
| 57 | 35834 | කාන්තා පාවහන් යුගලක් |

#### 2018 වර්ෂය - වෙන්දේසිය සඳහා නියමිත යතුරුපැදි

| අනු. අංකය | නඩු අංකය | යතුරුපැදියේ ලි. ප. අංකය | නිවැරදි ලි.ප. අංකය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | A/2557/16 | UN 3392 (3) | V.H. 3152 | |
| 02 | A/588/17 | JP 4992 (11) | J. P. 4992 | |
| 03 | A/592/17 (PR 1302/16) | අංක රහිත යතුරුපැදිය (10) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 04 | A/52117 | 127-4672 (12) | 127-4672 | |
| 05 | A/92/17 | 142-8176(8) | 142-8176 | |
| 06 | A/93/17 | MF 5300 (6) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 07 | A/113/17 | 112-9575 (5) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 08 | A/590/17 | 116-1645 (4) | 116-1645 | |
| 09 | A/265/17 | MP 4697 (15) | MP 4697 | |
| 10 | A/973/16 | 89 SRI 12363 (16) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 11 | A/222/15 | 104-0236 (21) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 12 | A/1349/14 | MA 0163 (20) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 13 | A/1711/16 | MG 3348 (19) | MG 3348 | |
| 14 | A/1346/14 | JA 3955 (34) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 15 | A/1802/15 | 116-5127 (26) | 116-5127 | |
| 16 | A/743/14 | 87 SRI 3410 (28) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 17 | A/2053/13 | අංක රහිත යතුරුපැදිය (29) | | |
| 18 | A/1805/15 | අංක රහිත යතුරුපැදිය (30) | TJ 8397 | |
| 19 | A/1352/14 | අංක රහිත යතුරුපැදිය (31) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 20 | A/1286/15 | MP 1518 (23) | | යතුරුපැදියක් ලෙස ලි.ප. කළ නොහැක |
| 21 | A/519/17 | UZ 6999 (14) | UZ6999 | |
| 22 | A/520/17 | අංක රහිත යතුරුපැදිය (24) | | |

#### 2015 සහ 2016 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද වෙන්දේසියට නියමිත භාණ්ඩ පිළිබඳ විස්තරය

| | | |
|---|---|---|
| 2015 වර්ෂය | පංකා 01 (සිටුවන ලද) | රු. 50.00 |
| | පරිගණක පුටු 01 | රු. 100.00 |
| | CN SK L -89176 (පරිගණක ප්‍රින්ටර්) | රු. 200.00 |
| | CN SK L -76507 (පරිගණක ප්‍රින්ටර්) | |
| | පුටු ලිපිකරු 01 | රු. 200.00 |
| | මේස ලිපිකරු 03 | රු. 2,500.00 බැගින් |
| | ෆැක්ස් යන්ත්‍ර 01 (32640) | රු. 300.00 |
| 2016 වර්ෂය | වායුසමන යන්ත්‍ර | රු. 200.00 |
| | ඇඳි පුටු 01 | රු. 10.00 |
| | පංකා 01 සිටුවන ලද | රු. 50.00 |
| | පංකා 01 (බිත්ති) | රු. 50.00 |
| | මේස ලී විධායක | රු. 3,000.00 |
| | මේස ලී 01 (Bar Table) | රු. 2,500.00 |

07-630

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය

නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.08.04 වැනි දින පෙ. ව. 10.00 මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.00 සිට 10.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

3. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

4. වෙන්දේසියෙන් මිළ දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

5. භාණ්ඩ මිළ දී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිළ දී ගන්නා ලද සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ආර්. එස්. එම්. විජේසේකර,<br>
දිසා විනිසුරු,<br>
නාවලපිටිය.

2018 ජූලි මස 05 වැනි දින,<br>
නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### නාවලපිටිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | ලී අල්මාරි | 05 |
| 02. | වානේ අල්මාරි | 05 |
| 03. | ආකෘති කබඩ් | 07 |
| 04. | ඡායා පිටපත් යන්ත්‍ර | 01 |
| 05. | ඡායා පිටපත් යන්ත්‍ර | 01 |
| 06. | පුටු (ඇඳි සහිත) | 15 |
| 07. | පුටු (ඇඳි රහිත) | 10 |
| 08. | බංකු (ඇඳි සහිත) | 02 |
| 09. | මේස ලිපිකරු | 02 |
| 10. | යතුරු ලියන | 08 |

07-708

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2018.08.04 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ.ව. 10.00 ට පෙර හිමිකම් තහවුරු කළ යුතු යි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 9.00 සිට 10.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිළදී ගන්නා සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිළදී ගන්නා ලද සියලුම භාණ්ඩ එදින ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ආර්. එස්. එම්. විජේසේකර,
දිසා විනිසුරු,
නාවලපිටිය.

2018 ජූලි මස 05 වැනි දින,
නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 79234 | ඉලෙක්ට්‍රිකල් වයර් කෝඩ් | 01 |
| 2. | 78988 | රිචාජබල් විදුලි පන්දම් | 01 |
| 3. | 78991 | කුඩා ගණක යන්ත්‍ර | 01 |
| 4. | 79187 | විදුලි පන්දම් | 01 |
| 5. | 78856 | අඟල් 1/2 ජලකරාම | 01 |
| 6. | 78665 | අඟල් 1/2 ජල කරාම | 01 |
| 7. | 78897 | විදුලි පන්දම් | 01 |
| 8. | 78663 | කුඩා ගණක යන්ත්‍ර | 01 |
| 9. | 77888 | අඟල් 1/2 ජලකරාම | 01 |
| 10. | 79554 | ප්ලාස්ටික් පැදුරු (චින්තා වර්ගයේ) | 01 |
| 11. | 79016 | ලී මිටක් සහිත යකඩ සවල් | 01 |
| 12. | 78811 | යකඩ මිට සහිත සවල් | 01 |
| 13. | 78812 | යකඩ මිට සහිත සවල් | 01 |
| 14. | 78934 | සවල් | 02 |
| 15. | 78790 | වක් පිහිය | 01 |
| 16. | බි 02/17 | D B 5200 වර්ගයේ දම්වැල් කියත (චේන්සෝ) හා එයට අදාල විවිධ උපකරණ කිහිපයක් අඩංගු හම් බෑගය, (සාමාන්‍ය තත්ත්වයේ පවතී.) | 01 |
| 17. | 61995 | STIHL වර්ගයේ දම්වැල් කියත් 01 යි. (චේන්සෝ) (සාමාන්‍ය තත්ත්වයේ පවතී.) | 01 |
| 18. | 74654<br>74557 | අංක 28 ශ්‍රී 3990 දරන ලොරි රථය (අබලිවලට යොදා ඇත.) | 01 |
| 19. | 74741 | අංක CPB AM-9114 දරන බජාජ් වර්ගයේ ඩිස්කවරි යතුරු පැදිය | 01 |
| 20. | 79092 | සුදු පැහැති බ්ලෙන්ඩරය අමතර උපාංග සහිත පෙට්ටිය | 01 |
| 21. | AR 208/17 | අඩි 03 ක් පමණ දිග ටකරන් තහඩු කෑලි | 02 |
| 22. | AR 206/17 | දිග අඩි 12 ක් වූ ටකරන් තහඩු<br>දිග අඩි 06 ක් වූ ටකරන් තහඩු | 05<br>02 |
| 23. | 63437 | දිග අඩි 06ක් පමණ දිග ටකරන් තහඩු | 09 |
| 24. | 77503 | බටර් පැහැති තීන්ත ආලේප කර ඇති ජනෙල් පියන්<br>උස අඩි 07 ක් වූ උලුවහු කඳන්<br>උස අඩි 04 ක් වූ උලුවහු කඳන්<br>දිග අඩි 10යේ ටකරන් තහඩු<br>කැට පැනෙල් දොරවල්<br>ජනෙල් පියන් | 03<br>02<br>01<br>09<br>01<br>02 |

#### හෙල්බොඩ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 41611 | D. R. L 5200 වර්ගයේ ධාරිතාව 5200 තලය සහිත දැම්වැල් කියත් (චේන්සෝ) (සාමාන්‍ය තත්ත්වයේ පවතී) | 01 |
| 2. | 43622 | වක් පිහි | 01 |
| 3. | 44422 | යකඩ පිහි | 01 |
| 4. | 44522 | තහඩු බැරල්<br>තහඩු බැරල් භාගේ (1/2) | 01<br>01 |
| 5. | 44466 | යකඩ සවල් | 02 |
| 6. | 44595 | ලාෆ්ස් (Laugfs) වර්ගයේ කහ පැහැති 5 kg ගෑස් සිලින්ඩරය | 01 |
| 7. | 32251 | එවරි බර්කල් වර්ගයේ තරාදි | 01 |

07-709

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### 2019 වර්ෂය සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2018.08.06 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2018.08.06 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2018.10.02 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිවේ.
/

එන්. එම්. ඥාණවතී,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.),
බදුල්ල.

2018 ජුනි මස 12 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**"බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය" 2019 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර 2019.01.01 වැනි දින සිට 2019.12.31 වැනි දින දක්වා**

| තැබෑරුමේ නම සහ ලිපිනය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2018.08.06 පෙ.ව.10.30 **නැවත විකුණන දිනය** .- සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2018.10.02 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ. |

07-267

### රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2019 වර්ෂය

පින්නවල අංක 02 රා තැබෑරුම

2019 ජනවාරි මස 01 වැනි දින සිට 2019 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයේ පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුයි :-

(i) 1982.08.20 වැනි දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව; හා

(ii) සුරා බදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්ව ය.

02. සෑම ටෙන්ඩර් අයදුම්පතක් වෙනුවෙන්ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක හෝ ලංකා බැංකු, දිස්ත්‍රික් ලේකම් ශාඛාවක මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. පින්නවල අංක 02 තැබෑරුම සඳහා රු. 1,500 ක් තැන්පත් කළ යුතු වේ.

03. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරා බදු කාර්යාලයකින් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය කවරයක බහා සීල් තබා එහි කෙළවර මුදුනේ "පින්නවල අංක 02 රා තැබෑරුම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර්පත " බව පැහැදිලිව සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පෙ" යන ලිපිනයට එවිය යුතු ය. නැතහොත් ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. සෑම ටෙන්ඩර්කරුවෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පතකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල ඉලක්කමෙන් සහ අකුරෙන් එවිය යුතු ය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය. සෑම ටෙන්ඩරයක්ම දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතු ය. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළ හැකි ය.

07. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිල දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රේන්ද විකිණීමේ කොන්දේසියට අත්සන් තබා ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල්, ඇප තැන්පත් වශයෙන් තැන්පත් කළ යුතු ය.

08. 2018 සැප්තැම්බර් මස 11 වැනි දින පෙ.ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

09. කිසිම හේතුවක් නොදන්වා ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම්ට පැවරී ඇත.

10. පූර්වෝක්ත දිනයේ විකිණීමට නොහැකි වූ තැබෑරුමක්, රේන්දයක් වෙතොත් ඒවා නැවත විකිණීම 2018.11.01 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. 2018 වර්ෂය සඳහා දැනට තැබෑරුම පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළ ගොඩනැගිලි සොයා ගත යුතු අතර එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරිය බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

12. වැඩි විස්තර ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

2018 ජුනි මස 21 වැනි දින,
ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | පිහිටි ප්‍රදේශය | තැබෑරුම විවෘත කර තැබිය යුතු වේලාවන් | ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව |
|---|---|---|---|---|
| අංක 02 පින්නවල රා තැබෑරුම | කඩවත කෝරළය | පින්නවල ගම තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2018.09.11 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

07-269

### දැන්වීමයි

2018.06.18 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : හිරිකැටිය එවර්ග්‍රීන් ප්‍රොපර්ටි සේල්ස් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පී වී 132154

ලියාපදිංචි කාර්යාලය : අංක 112 ඒ, ගලේවත්ත, හිරිකැටිය, දික්වැල්ල.

කේතකී සුභාෂණී මාදුගොඩ,
ලේකම්.

2018 ජුනි මස 29 වැනි දින.

07-441

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඒ. එස්. කේ. ෆුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 00200774
ලියාපදිංචි ලිපිනය : අක 519/ඊ, නාරන්ගොඩපාලුව, බටුවත්ත.

07-417

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : කොකොමෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00200423
ලියාපදිංචි ලිපිනය : අංක 7/11, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ.

07-416

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : නිව් සිටි ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200422
ලියාපදිංචි ලිපිනය : අංක 7/11, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ.

07-415

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : නිව් පොයින්ට් ඉන්වෙස්ට්මන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200421
ලියාපදිංචි ලිපිනය : අංක 7/11, පළමුවන පටුමග, විජය මාවත,මිනුවන්ගොඩ.

07-414

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඩ්‍රොයිට් වෙරිටාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 132111
ලියාපදිංචි කාර්යාලය : අංක 19/3, ස්වර්ණ පාර, කොළඹ 06,
සංස්ථාගත කළ දිනය : 2018 ජුනි 04

සමාගම් ලේකම්වරු.

07-454

---

### මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2018 මැයි 10 වැනිදා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : මෙයිලි ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 131957
ලියාපදිංචි කාර්යාලය : අංක 86/ඒ, දන්තුරේ පාර, අරබේගම, පිළිමතලාව.

සමාගම් ලේකම්.

07-413

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ගාල්ල පදිංචි මොරගොඩගේ දෙන් අසේල දිනේෂ් පින්තු සහ අරුණි නිරංගා අබේසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1 වන වෙන්දේසිය .-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර-බටහිර 98 ඩී ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2010.01.30 දිනැති අංක 11/2010 දරන සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත *හෙවත්* හත්තොටුවගේවත්ත නමැති ඉඩමේ එකතු කළ සහ යාව පිහිටි ලොට් ඒ සහ බී වල සහ බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.08 දිනැති අංක 04/2015 සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත සහ හත්තොටුවගේවත්ත නමැති එකතු කළ ඉඩමේ ලොට්ස් ඒ සහ බී වල ලොට් 4 හි ලොට් 4 බී වල වෙන්කළ ලොට් 5 නමැති යාව පිහිටි සහ එකතු කළ ඉඩම් කැබලි දෙකෙහි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.18 දිනැති අංක 09/2015 සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13.0) *නොහොත්* හෙක්ටයාර් 0.03288ක් විශාල බිම. ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අංක 11/2010 සැලැස්මේ නිරූපණය වන ලොට් 8 ලකුණු කළ ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපළ 2018 ජූලි මස 31 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - දංගෙදර මංසන්ධියේ සිට ස්ටීල් පාර ඔස්සේ මීටර 100ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති මල්වත්ත පන්සල පාරට හැරී තවත් මීටර් 100ක් පමණ ගිය විට වම්පසට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මඳ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

2 වන වෙන්දේසිය. - දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර නැගෙනහිර 97 ඩී ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.07.24 දිනැති අංක 88/2015 සැලැස්මේ නිරූපණය වන එගොඩතුඩුවේ වත්ත *හෙවත්* කැබැල්ලගහවත්ත 7 ඒ අමුකනත්තේවත්ත අද්දර ඕවිට *හෙවත්* මහදූව අද්දර කැකුලන් ඕවිට ලොට් ඒ සහ මහදූව අද්දර ඕවිට ලොට් ඒ නමැති යාව පිහිටි ඉඩම් කැබලිවල ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහහතයි දශම දෙකයි අටක් (අ. 0 රූ. 0 පර්. 17.28) *නොහොත්* හෙක්ටයාර් 0.0437 ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2018 ජූලි මස 31 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- දංගෙදර මංසන්ධියේ සිට හිරිඹුර පාර ඔස්සේ මීටර් 400ක් පමණ ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ *ගැසට් පත්‍රයේ* 2018.05.25 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.28 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2018.05.25 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක : 011- 2456481, 2456478.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකතන අංක : 011 - 3068185, 011- 2572940.

07-307

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ගාල්ල ව්‍යාපාර ලියාපදිංචි අංක ජී/9580 යටතේ අත්සරා එන්ටප්‍රයිසස් ඇන්ඩ් මෝටර් ට්‍රේඩිං යන නාමය, විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයන් පවත්වාගෙන යන ගාල්ල පදිංචි මොරගොඩගේ දෙන් අසේල දිනේෂ් පින්තු සහ අරුණි නිරංගා අබේසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර බටහිර 98 ඩී ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිං විසින් සාදන ලද 2010.01.30 දිනැති අංක 11/2010 දරන සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත *හෙවත්* හත්තොටුවගේවත්ත නමැති ඉඩමේ එකතු කළ සහ යාව පිහිටි ලොට් ඒ සහ බී වල සහ බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.08 දිනැති අංක 04/2015 සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත සහ හත්තොටුවගේවත්ත නමැති එකතු කළ ඉඩමේ ලොට්ස් ඒ සහ බී වල ලොට් 4 හි ලොට් 4 බී වල වෙන්කළ ලොට් 5 නමැති යාව පිහිටි සහ එකතු කළ ඉඩම් කැබලි දෙකෙහි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.18 දිනැති අංක 09/2015 සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13.0) *නොහොත්* හෙක්ටයාර් 0.03288 ක් විශාල බිම, ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අංක 11/2010 සැලැස්මේ නිරූපණය වන ලොට් 8 ලකුණු කළ ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ.

ඉහත සඳහන් දේපළ 2018 ජූලි මස 31 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - දංගෙදර මංසන්ධියේ සිට ස්ටීල් පාර ඔස්සේ මීටර 100ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති මල්වත්ත පන්සල පාරට හැරී තවත් මීටර් 100ක් පමණ ගිය විට වම්පසට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මඳ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ *ගැසට් පත්‍රයේ* 2018.05.25 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2018.05.25 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 09, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක 011- 2456465, 2456476.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකතන අංක : 011 - 3068185, 011- 2572940.

07-306

---

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - වීරකැටිය ශාඛාව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, බැදිගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බැදිගම ගමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 53 ක්ෂේත්‍ර පත්‍රයෙහි අ. ග.සි. 261 දරන පිඹුරේ අංක 712 දරන ඉඩම සම්බන්ධව අවසරලත් මානක චන්ද්‍රසිරි කුමාරගේ මහතා විසින් 1997.07.13 වැනි දින මැන සකස් කරන ලද අංක 970702 දරන පිඹුර අනුව බෙදවෙන්කළ අංක 712 ඒ දරන රූඩ් තුනයි පර්චස් දහ තුනක් *හෙවත්* (අ. 0, රූ. 3, පර්. 13) *හෙවත්* හෙක්ටයාර් බින්දුවයි දශම තුනයි හයක් (හෙක්. 0.336) විශාල ඉඩමේ සියලු වැවිලි සමග බිම ද එහි තුළ පිහිටි ගොඩනැගිලි ද,

විතාරන්දෙණිය, බැදිගම ''පවිත්‍ර පුතා'' අංක 136 ඊ හි පදිංචි වික්‍රමආරච්චිගේ ලීලාවතී හා එම ලිපිනයේ ම පදිංචි රත්නායක කංකානම්ලාගේ ලක්ෂ්මි සරංග නී *හෙවත්* රත්නායක කංකානම්ගේ ලක්ෂ්මි සරංගනී *හෙවත්* රත්නායක කංකානම්ගේ ලක්ෂ්මි සරංගනී රත්නායක කංකානම්ගේ (ඉතිරි කිරීම් ගිණුම් අංක 231010111777 සහ ණය ගිණුම් අංක 2310597000306) බන්ධනදයින් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇති දේපල,

වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 10 වැනි දින පෙ. ව. 11.00 සිට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.11.17 දින රජයේ *ගැසට් පත්‍රය* ද 2018.01.09 දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - වීරකැටිය පස් මංහන්දියේ සිට තංගල්ල පාරේ කි. මී. 02ක් පමණ ඉදිරියට ගිය විට හමුවන මාරගහ හන්දිය දක්වා ගමන් කර වම් අතට දිවෙන තීරවල පාරට හැරී මීටර් 100ක් පමණ ගමන් කර දකුණු පසින් පිහිටි මෙම දේපළට ළඟාවිය හැකි ය.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු මිළ තීන්දු කළවහාම මතු දක්වා ඇති ගාස්තු මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 25%, (2) පළාත් පාලන බදු 1%, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%, (4) නියමිතය රජයේ ගාස්තු, (5) සියළුම ප්‍රචාරක වියදම්, (6) ලිපිකරු හා සෝෂක ගාස්තු රු. 1,500, (7) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. 2,000, ගැණුම් මිලෙන් ඉතිරි 75% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 25%ක මුදලක් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සහ හිමිකම් ඔප්පු හා අදල ලියවිලි මාතර, උයන්වත්ත, උයන්වත්ත වට රවුම් පාරේ අංක 28 බී ලිපිනයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ දකුණු පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිගෙන් ලබාගත හැකිය.

දුරකතන අංක 041 2226208/041 2226209.

07-285

---

### සෙලාන් බැංකුව පීඑල්සී - අත්තිඩිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ කොළඹ ලියාපදිංචි අංක පී වී 14667 දරන හාර්කෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

1 වන වෙන්දේසිය .-

බස්නාහිර පළාතේ, (දෙල්කඳ - නුගේගොඩ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල පිහිටි බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද 2009 අප්‍රේල් මස 10 දිනැති අක 7540 දරන සැලැස්මේ නිරූපණය වන දුම්රියපල පාර වරිපනම් අංක 20 දරන ඇපොතිකරියාවත්ත නමැති ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (දෙහිවල කාණ්ඩ 14/235 හි ලියාපදිංචි) (හානි වී ඇත) සහ 89/199 (අවසාන) ලියාපදිංචි සැලසුම් අංක 1 හි ලොට් 76 $^{C1}$ හි නැවත මැනීමක් වන ලොට් 5403 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 7540 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දෙළහයි දශම තුනයි එකක් (අ. 0 රූ. 01, පර්. 12.31) *නොහොත්* (හෙක්ටයාර් 0.1323) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2018 ජූලි මස 30 වැනි දින පෙරවරු 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - කොළඹ සිට ගාලු පාර ඔස්සේ කි. මී. 10 ක පමණ දුරක් ගොස් දෙහිවල මංසන්ධිය දක්වා පැමිණ දුම්රියපොල පාරට හැරෙන්න. (මුහුද පැත්තේ පිහිටි) එම දුම්රියපොල පාරේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට අදළ දේපළ මාර්ගයේ දකුණු පසින් හාර්කෝට්ස් ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයට සහ ෆාමසි ගොඩනැගිල්ලට යාබද ව පිහිටා ඇත.

2 වන වෙන්දේසිය. -

බස්නාහිර පළාතේ, (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය සභාවේ, බොරලැස්ගමුව උප කාර්යාල සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1999 මැයි මස 03 දිනැති අංක 198/9000 දරන සැලැස්මේ නිරූපණය වන පරණ කැස්බෑව පාර, දැන් වරිපනම් අංක 40/6 දරන දවටගහදෙනිය හෙවත් ඕවිට නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1990.11.06 දිනැති අංක 1516 සැලැස්මේ නිරූපණය වන ලොට් 7 හි නැවත මැනීමක් වන) ලොට් 7 ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 198/9000 දරන සැලැස්ම අනුව පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) විශාල ඉඩම.

පහත සඳහන් පාර සඳහා වෙන් කිරීම තුළ උඩින්, යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් සියලු අයිතීන් සමග.

පෙර කී බොරලැස්ගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1990.11.06 දිනැති අංක 1516 සැලැස්මේ නිරූපණය වන දවටගහදෙනිය *හෙවත්* ඕවිට නමැති ඉඩමේ ලොට් ඒ (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1516 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර් 20) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2018 ජූලි මස 30 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - හොරණ පාරේ පිහිටි රත්තනපිටිය මංසන්ධියේ සිට පරණ කැස්බෑව පාර ඔස්සේ දෙල්කඳ හංදිය දෙසට මීටර් 250 ක පමණ දුරක් ගිය විට ඇති පොලික්‍රෝම් ආයතනය අසලින් දකුණු පසට ඇති තාර පාරට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 50 ක පමණ දුරක් ගිය විට අදළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ *ගැසට් පත්‍රයේ* 2018.05.25 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.28 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.05.25 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තිරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක 011- 2456463, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011- 3068185, 011- 2572940.

07-308

---

HNB 04 - 18(i)

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - ඌරුබොක්ක ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද, 2015 ජූනි 22 දින සහතික කළ අංක 14990 දරණ බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම මධුර රාජපක්ෂ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී වර්ෂ 2018 ක් වූ ජූලි මස 31 වැනි දින ප. ව. 12.30ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ -

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරවක් කෝරළේ පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල ගින්නලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගින්නලියහි පිහිටි (එෆ්. වී. පී. 22 ලොට් 53 ඒ) මහහේන මලිත්තිගේහේන සහ දෙල්ගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2015 ජූනි මස 13 වන දින පිළියෙල කරන ලද අංක 117/2015 දරණ පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 8ඒ දරණ අක්කර දොළහයි රූඩ් දෙකයි පර්චස් හයයි දශම හතයි අට (අ.12 රූ.2 පර්. 6.78) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක් කෝරලේ පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල ගින්නලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගින්නලියහි පිහිටි (එෆ්. වී. පී. 22 ලොට් 53 ඒ) මහහේන මලිත්තිගේහේන සහ දෙල්ගහහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් 1996 ජනවාරි මස 05 වන දින පිළියෙල කරන ලද අංක: 1163 දරණ පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 9 දරණ අක්කර දහතුනයි රූඩ් තුනයි පර්චස් බිංදුවයි දශම අටයි හත (අ.13 රූ.3 පර්. 0.87) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.05.18 වැනි දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2018.05.30 දිනැති ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

අංක 1, 2 දේපළට පිවිසීම. - ඌරුබොක්ක කොටපොල පාරේ බෙරලපනාතර පට්ටිගල පාර දක්වා ගොස් එම පාරේ කි. මී. 02ක් පමණ ගිය පසු එම මාර්ගයේ දකුණු අත පැත්තේ දේපල පිහිටා ඇත.

මීටර් 300ක් පමණ ගමන් කළ පසු එම මාර්ගයේ දකුණු අත පැත්තේ දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක්ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු.2000/-) ක්ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු.500) ක්ද,
6. සියළුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී, අංක 479, ටී. බී. ජයා මාවත කොළඹ 10.

දුරකථන :- 011-2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව
දුරකථන- 091-2277105, 0779-663420,
ඊ මේල් :- ejayawardhana77@gmail.com

07 - 419/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - ඌරුබොක්ක ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද, මාතර ප්‍රසිද්ධ නොතාරිස් යූ. එන්. චන්ද්‍රලතා විසින් 2016 මාර්තු 12 දින සහතික කළ අංක 9610 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම මධුර රාජපක්ෂ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී වර්ෂ 2018 ක් වූ ජූලි මස 31 වැනි දින ප. ව. 2.00ට එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ -

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැකිලියාතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඌරුබොක්ක හි පිහිටි මනන්කැටියාවලහේන *හෙවත්* මනන්කැටියහේන යාබදව ඇති ලොට් අංක 1, 2 හි ලොට් 4 හි ලොට් 16 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. වී. පී. බී. කීර්තිලාල් විසින් 2013 සැප්තැම්බර් මස 28 වැනි දින පිළියෙල කරන ලද අංක 196/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක ඩී 1 දරන පර්චස් තිස්තුන (අ.0 රූ.0 පර්.33) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.05.18 වැනි දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2018.05.30 දිනැති ලක්බිම ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම. - ඌරුබොක්ක මාතර පාරේ කි.මී. 01ක් පමණ ගොස් පාලම අසලින් වමට හැරී එම පාරේ මීටර් 300ක් පමණ ගමන් කළ පසු එම මාර්ග යේ දකුණු අත පැත්තේ දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක්ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු.2000/-) ක්ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු.500) ක්ද,
6. සියළුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛණ පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී, අංක 479, ටී. බී. ජයා මාවත කොළඹ 10.

දුරකතන :- 011-2661828, 2661866

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව
දුරකථන- 091-2277105, 0779-663420,
ඊ මේල් :- ejayawardhana77@gmail.com

07 - 419/2

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේදී එකී දේපළ පිහිටි ස්ථානයේදී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුල, වෝඩ් අංක 15, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩපාත 567 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මඩපාත ග්‍රාමයේ පිහිටා ඇති, මඩපාත පාරේ, වරිපනම් අංක. 894/32 දරන ''මහවත්තේ කුරුඳුවත්ත, මොරගහවත්ත සහ දැනට විජේහේන එස්ටේට් (කොටසක්)''යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට, බලයලත් මානක ටී. ඩී. කේ. ආර්. පී. පාතේගම විසින් මැන සකසන ලද වර්ෂ 2014.07.26 දිනැති අංක 4525 දරන පිඹුරෙහි (බලයලත් මානක ඩී. ඩී. හෙට්ටිගේ විසින් මැන සාදන ලද වර්ෂ 1991.04.29 දිනැති අංක 2621 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් බෙදා වෙන් කර දක්වා ඇති ඉඩම නැවත මැනීමකි.) ලොට් 3 A යනුවෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැවිලි ආදී සෑම සියලු දේද සමග වේ. බිම් ප්‍රමාණය (අ. 0, රූ. 0,පර්. 12.60)

වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 06 වැනි දින පෙ.ව . 10.30 ට

දේපළට පිවිසීම. - කොළඹ සිට පිළියන්දල දක්වා ගමන් කර හොරණ පාරේ මීටර් 250ක් පමණ ගමන් කර දකුණට හැරී මඩපාත පාරේ කි. මී. 3.7ක් පමණ මල් මාවත දක්වා ගමන් කරන්න. ඉන්පසු දකුණට හැරී මීටර් 30ක් පමණ ගමන්කළ පසු දකුණු අත පැත්තේ විෂය ගත දේපළ පිහිටා ඇත.

ඇත්තනී බදුගේ ප්‍රදීප් බිෂ්වජිත් සිල්වා බන්ධනදායී උකස්කරු වශයෙන් ද, නාරන්ගොඩ රාළලාගේ ප්‍රියංගා දිල්රුක්ෂි යන අය බන්ධනදායී වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.09.22 දිනැති අංක 545 දරන උකස් බැදුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.06.22 වැනි දින දිවයින, දී අයිලන්ඩ් පුවත් පත් සහ එදින රජයේ ගැසට් පත ද සහ 2018.06.25 වැනි දින තිනක්කුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයඃ

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු.1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90%ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ප්‍රධානී - ණය අයකර ගැනීම්, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන 011-4667230, 0114667237.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකතන/ෆැක්ස් අංක : 081 - 2210595
ජංගම දුරකතන : 071-4755974/071-4962449.

07-404

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එස්. සූතාකරන්.
ගිණුම් අංක: 0125 5000 0391.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.04.26 වෙනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ පන් ලක්ෂ අනූ හත් දහස් දෙසිය හතලිස් හතයි ශත පහක (රු. 7,597,247.05) මුදලද, 2018 අප්‍රේල් 08 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ හතර ලක්ෂ හාර දහස් තුන්සිය අනූ හතයි ශත හතක (රු. 7,404,397.07) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක (10.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත්, ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.06.22 දින රජයේ ගැසට් පත්‍රයේ 2018.06.06 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2018.08.01 දින පෙ.ව. 11.30ට සහ පෙ.ව. 10.00ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. නැගෙනහිර පළාතේ, මඩකලපු දිස්ත්‍රික්කයේ එරුවිල් පත්තුවේ පඩ්ඩිරුප්පු ග්‍රාමයේ පිහිටි ලොට් අංක. 05 වශයෙන් නිරූපිත ''පඩ්ඩිරුප්පු වලව්'' කියනු ලබන ඉඩම් කොටසට මායිම්: නැගෙනහිර සහ බස්නාහිරට: විකුණුම්කරුගේ

ඉතිරි ඉඩම දකුණට: ප්‍රධාන පාර උතුරට : සුබ්‍රමනියම් ගේ අනෙක් කොටස සහ ප්‍රමාණයෙන් උතුර සිට දකුණට අඩි 78 නැගෙනහිර සිට බස්නාහිරට උතුරු පසින් අඩි 16 1/2, දකුණු පසින් අඩි 16 1/2 යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස එහි අඩංගු සැම සියළුදේද සියළුම අයිතීන් ද සමග H155/209 යටතේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඒ. ර්. කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2012 මාර්තු 17 දාතම හා අංක 415/2012 දරන පිඹුරේ නිරූපිත ඉහත උපලේඛණයේ විස්තර කොට ඇති ඉඩම පහත සඳහන් පරිදිය.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල් පත්තුවේ මංමුනායි දකුණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ එරුවිල් පත්තු සහ මංමුනායි දකුණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පඩ්ඩිරුප්පු ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන ඒ. ර්. කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2012 මාර්තු 17 දාතම හා අංක 415/2012 දරන පිඹුරේ නිරූපිත ''පඩ්ඩිරුප්පු වලව්'' කියනු ලබන ඉඩම් කොටසට මායිම්: උතුරට: සුබ්‍රමනියම් සහ වෙනත් අයගේ වත්ත නැගෙනහිරට: වී. බාල සුබ්‍රමනියම් යන අයගේ වත්ත දකුණට : පඩ්ඩිරුප්පු පාර සහ බස්නාහිරට: වී. බාලසුබ්‍රමනියම් යන අයගේ වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0106 හෝ පර්චස් හතරයි දශම එකයි නමයක් (අක්. 0 රූඩ් 0 පර්.. 4.19) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සාප්පු ගොඩනැගිල්ල සහ එහි අඩංගු සැම සියළු අයිතීන් ද සමගය. මෙම දේපළ පඩ්ඩිරුප්පු G. S. O. කොට්ඨාසයේ පිහිටා ඇත.

උකස් බැඳුම්කර අංක. 6948 සහ 8989 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ මංමුනායි පත්තුවේ මංමුනායි උතුර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ මඩකලපුව මහ නගර සභා සීමාවන් තුළ වෝඩ් අංක 08 කොඩ්ඩායිමුනායි ග්‍රාමයේ බාර් පාරේ පිහිටි වරිපනම් අංක 364/20 දරන බලයලත් මානක තැන ඒ. ර්. කේ. තිස්සේවේරසිංහ යන අය විසින් සාදන ලද 2015 මැයි 11 දාතම හා අංක 503/2015 නිරූපිත (බලයලත් මානත තැන ඒ. සිංගරාජා යන අය විසින් සාදන 2011 අප්‍රේල් 10 දාතම හා අංක. AS/11/MN/72 දරණ පිඹුරේ නිරූපිත) ඉඩම් කොටසට මායිම් උතුරට: මනොරංජිතම් යන අයගේ වත්ත නැගෙනහිරට: එන්. ප්‍රෙම්ලාතේවි යන අයගේ වත්ත දකුණට: අංක 96/2003 දරන පිඹුරේ ලොට් 06 සහ 08 සහ බස්නාහිරට: අංක 96/2003 දරන පිඹුරේ ලොට් 08 සහ බාර් පාර වෙත දිවෙන 3.0m පළල පටුමග යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0180 හෝ පර්චස් බිංදුවයි හතයි දශම එකයි බිංදුවක් (A:0 R:0 P:07.10 ) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සැම සියලු දේ ගොඩනැගිල්ල, ලිඳේ කොටස සහ එහි අඩංගු සැම සියලු අයිතීන් ද සමගය. මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 675/168 යටතේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක. 5368 සහ 8991 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

07 - 398

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ගාල්ල කොටුව ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 98B බටගන්විල ග්‍රාම නිලධාරි වසමේ බටගන්විල ශ්‍රී හේමානන්ද මාවතේ වරිපනම් අංක 68 හි ''අඹගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2003 අගෝස්තු මස 07 වන දින මැන සාදන ලද අංක 48/2003 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් '' B ' දරන ඉඩම

ප්‍රමාණය පර්චස් විසිනවයයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 29:20) හෝ හෙක්ටයාර් 0.07386 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගෙදර නැගෙනහිර 97D ග්‍රාම නිලධාරි වසමේ දංගෙදර හේන්රි පේඩිරිස් මාවතේ වරිපනම් අංක 384 (කොටසක්) හි පිහිටි ''පස්හවුල් ඔවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2013 ඔක්තෝබර් මස 02 වන දින මැන සාදන ලද අංක 66/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3A වශයෙන් දැක්වෙන ඉඩම.

ප්‍රමාණය පර්චස් තිස්නවයයි දශම පහයි තුනක් (අ. 0 රූ. 0 පර්. 39.53) හෝ හෙක්ටයාර් 0.09998 විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගෙදර නැගෙනහිර 97D ග්‍රාම නිලධාරි වසමේ දංගෙදර හේන්රි පේඩිරිස් මාවතේ වරිපනම් අංක 384 (කොටසක්)හි පිහිටි ''පස්හවුල් ඔවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2013 ඔක්තෝබර් මස 02 වන දින මැන සාදන ලද අංක 66/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3B2 අනුව

ප්‍රමාණය පර්චස් විසිපහක් (අ. 0 රූ. 0 පර්. 25) හෝ හෙක්ටයාර් 0.06323 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගෙදර නැගෙනහිර 97D ග්‍රාම නිලධාරී වසමේ දංගෙදර හේන්රි පේඩිරිස් මාවතේ වර්තමානයේ වරිපනම් අංක 384 (කොටසක්) හි පිහිටි ''පස්හවුල් ඔවිට'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. බී. එස්. බන්දුල සිල්වා විසින් 2013 ඔක්තෝබර් මස 02 වන දින මැන සාදන ලද අංක 66/2013 දරන පිඹුරෙන් ලොට් 2B1 දරන ඉඩම

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දෙකයි දශම හයයි බිංදුවයි (අ. 0 රූ. 1 පර්. 2.60) හෝ හෙක්ටයාර් 0.10775 ක විශාලත්වයෙන් යුක්තවූ ඉඩමට ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**තුන්වන උපලේඛනය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගෙදර නැගෙනහිර 97D ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ''පස්හවුල ඔවිට'' නමැති ඉඩමෙහි ලොට් 9 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. වෙවැල්වල, විසින් 2005 සැප්තැම්බර් මස 30 වන දින මැන සාදන ලද අංක 798 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 9A දරන ඉඩම

ප්‍රමාණය පර්චස් දහතුනක් (අ. 0 රූ. 0 පර්. 13) හෝ හෙක්ටයාර් 0.0329 ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩමට ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ, ගාල්ල මහනගර සභා සීමාව තුළ, ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දංගෙදර නැගෙනහිර 97D ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ''පස්හවුල ඔවිට'' නමැති ඉඩමෙහි ලොට් 9 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. වෙවැල්වල, විසින් 2005 සැප්තැම්බර් මස 30 වන දින මැන සාදන ලද අංක 798 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 9B දරන ඉඩම

ප්‍රමාණය පර්චස් හතක්(අ. 0 රූ. 0 පර්. 7) හෝ හෙක්ටයාර් 0.0179 ක් විශාලත්වයෙන් යුක්ත වූ ඉඩමට ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**හතරවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ බියන්විල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පහළ බියන්විල ගමෙහි පිහිටි, නුවර පාරේ, වර්තමානයේ වරිපනම් අංක 336 සහ 344/1 හි ''දෙල්ගහවත්ත සහ දෙල්ගහවත්තේ කැබැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ.ආර්. අලහකෝන් විසින් 2013 මැයි මස 29 වන දින මැන සාදන ලද අංක 1835 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම තුනයි බිංදුවක් (අ. 0 රූ. 1 පර්. 0.30) හෝ හෙක්ටයාර් 0.10193ක් විශාල ඉඩම වේ. විශාලත්වයෙන් යුක්ත වූ ඉඩමට ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ බියන්විල නැගෙනහිර ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, පහළ බියන්විල ගමෙහි ''දෙල්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පි. අතුරුලිය විසින් 1965 ජනවාරි 13 වැනි දින මැන සාදන ලද අංක 1649 දරන පිඹුරේ අඩි 7-අඩි 4 පළල පාරක් සඳහා වෙන් කර ඇති ලොට් 2 නමැති ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් බිංදුවයි හතයි දශම එකයි පහක් (අ. 0 රූ. 0 පර්. 7.15) විශාලත්වයෙන් වූ ඉඩමට ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

මෙහි පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ස්ථාපිත සමාගමක් වන පොල්ගස්ඕවිට, මත්තේගොඩ, සිරිමල් උයන අංක 38 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සිටි ෆැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ පල්ලිය ගුරුගේ අජිත් උපමාලක නානායක්කාර උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. උකස් කර ඇත.

මෙහි හතරවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ස්ථාපිත සමාගමක් වන පොල්ගස්ඕවිට, මත්තේගොඩ, සිරිමල් උයන අංක 38 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සිටි ෆැෂන් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. උකස් කර ඇත.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ

1 හතරවන උපලේඛනය
සඳහන් පහළ බියන්විල පිහිටි දේපළ ලොට් A (අ. 0 රූ. 1 පර්. 30) 2018ක් වූ අගෝස්තු මස 02 වැනි දින පෙ. ව. 10.30 ට

2 පළමුවන උපලේඛනය
පහළ බටගන්විල පිහිටි දේපළ ලොට් B (අ. 0 රූ. 0 පර්. 29.20) 2018ක් වූ අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 11.00ට ද,

3. දෙවන උපලේඛනය
සඳහන් බටගන්විල පිහිටි දේපළ ලොට් 3A (අ. 0 රූ. 0 පර්. 39.53) ලොට් 3B2 (අ. 0 රූඩ්. 0 පර්. 0.25) ලොට් 2B1 (අ. 0 රූ. 1 පර්. 2.60) 2018ක් වූ අගෝස්තු මස 03 වැනි දින පෙ. ව. 11.45ට ද,

4. තුන්වන උපලේඛනය
සඳහන් ගාල්ල දංගෙදර ලොට් 9A, අ.0 රූ. 0 පර්. 13 ලොට් 9B (අ. 0 රූ. 0 පර්. 7) 2018ක් වූ අගෝස්තු මස 03 වැනි දින ප. ව. 12.30ට ද

අදාළ දේපළ පිහිටි ස්ථාන වලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.07.06 වන දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2018.07.06 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2018.07.13 වන දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2018.07.13 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. -

පළමුවන උපලේඛනය ලොට් B .- ගාල්ල නගරයේ සිට වක්වැල්ල කි. මී. 2.5ක් ගමන් කර ජුල් ගස් හංදියට පැමිණ, එතැන් සිට දකුණු පසින් පිහිටි හේමානන්ද මාවතේ (කුබල්වැල්ල පාර) මීටර් 600 ක් පමණ ගමන් කළ විට හමුවන බටගන්විල හංදියෙන් අදාළ දේපලට ළඟා විය හැක. අදාළ දේපළ හේමානන්ද මාවත සහ එළියට් පාරට මායිම්ව දකුණු අත පැත්තේ පිහිටා ඇත.

දෙවන උපලේඛනය ලොට් 3A, 3B2 සහ ලොට් 2B1

ගාල්ල නගරයේ සිට බද්දේගම පාරේ කි.මි. 2.10ක් පමණ ගමන් කර දංගෙදර හංදියට පැමිණ (යු කේ ජී මහගෙදර පසුකර මීටර් 100ක්) මීටර් 300 ගමන් කළ පසු අදාළ දේපල දකුණු අත පැත්තේ බද්දේගම පාරට මායිම්ව පිහිටා ඇත.

තුන්වන උපලේඛනය ලොට් 9A සහ ලොට් 9B .-

ගාල්ල නගරයේ සිට බද්දේගම පාරේ කි.මි. 2.10ක් පමණ ගමන් කර දංගෙදර හංදියට පැමිණ (යු කේ ජී මහගෙදර පසුකර මීටර් 100ක්) එතැන් සිට මීටර් 150 ගමන් කළ පසු සන් ලංකා ප්‍රදර්ශනාගාරය හමුවේ. එතැනින් දකුණට හැරුනු විට ඇති කොන්ක්‍රීට් කරන ලද සමගිවත්ත පාරේ මීටර් 200ක් පමණ ගොස් වමට හැරී මීටර් 50 ගිය විට අදාළ දේපළ අඩි 10 පමණ පළල කොන්ක්‍රීට් කරන ලද පාරට මායිම්ව වම් පසින් හමුවේ.

හතරවන උපලේඛනය ලොට් A .

කඩවත නගරයේ සිට නුවර පාරේ මීටර් 250ක් එම පාරේ කොළඹ දෙසට ගමන් කළ විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීම් කළයුතු ආකාරය - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%)
(04) නොතාරිස් ගාස්තුව රු. 2,000/-
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/-
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්
(07) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි
(08) ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90 %) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල කොටුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න-

එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස්
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙනදේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, 2 වන මහල,
හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 0773242954
දුරකථන / ෆැක්ස් 0112-445393.

කළමණාකරු අයකිරීම්,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 22, පල්ලිය පාර,
කොටුව, ගාල්ල,
දුරකථන අංක : 0912232223, 0912242771
ෆැක්ස් : 0912242770

07 - 410

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
**(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 489 සහ 490 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්පාර නගර සභා සීමාවට අයත්, සේනානායකපුර ග්‍රාම නිලධාරි වසමේ, අම්පාර F කලාපය වැව්ගම්පත්තුවඋතුරේ පිහිටි, බෝඩ් ලෑන්ඩ් ලෙස හැඳින්වෙන මිනින්දෝරු ජනරාල්වරයා විසින් සාදන ලද කැඩැස්තර පිඹුරුපත් අංක 280010 දරන පිඹුරේ ලොට් අංක 39 ලෙස දැක්වෙන වරිපනම් අංක 42 දරන බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර 0.0927 එහි පිහිටි සියල්ල සහිතව

අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් සසිකා නිරෝෂිනි සෙක්සස් ද සිල්වා විසින් සහතික කරන ලද 2014 මාර්තු මස 20 වැනි දිනැති අංක 489 සහ 490 දරන උකස්කරයන් ප්‍රකාර සේනකි පෙරසවි ටයර් ඉන්ඩස්ට්‍රීස් නම් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන සමන්ප්‍රිය අමරසිංහ සහ අස්ගිරියගේ තිලක් සෙනෙවිරත්න යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (කලින් ඩී එෆ් සී සී බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 අගෝස්තු මස 01 වැනි දින (බදාදා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පලාත් අධිකාරිය ට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. රු. 151,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011- 2371371

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-326

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩබ්ලිව්.ජී. දිල්හාන් සහ ටී.ආර්. ධර්මරත්න.
ගිණුම් අංක : 1003 5442 0462.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 2018.04.26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට තුන් ලක්ෂ විසි හය

දහස් එකසිය හැත්තෑ තුනයි ශත විස්සක (රු. 6,326,173.20) මුදලද, 2018 මාර්තු මස 27 වැනි දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් නම ලක්ෂ හැත්තෑ හත් දහස් හාරසිය එකොළහයි ශත හැත්තෑ හතක (රු. 5,977,411.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.06.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2018.06.06 වැනි දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2018.08.03 වැනි දින ප.ව. 02.00 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහරගම නගර සභා සීමාවන් තුළ මාදිවෙල අංක 524 - දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාදිවෙල පිහිටි මාදිවෙල පාර වරිපනම් අංක. 352/D4 දරන "නින්දෝරවැල්ල කුඹුර, පරගහ කුඹුර, බෙල්අත්තේ කුඹුර, දෙල්ගහ කුඹුර, අඹගහ කුඹුර, පුවක්වැටිය කුඹුර, පැලැන්ගහ කුඹුර සහ කැකුණගහ කුඹුර" (බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 17 දාතම හා අංක 2252 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි දැනට පවත්නා සීමාවන් මත නැවත මිනුමක් සහ උපබෙදුමක් වන) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එම්. ඒ. එච්. බණ්ඩාර යන අය විසින් සාදන ලද 2009 ඔක්තෝබර් මස 25 දාතම හා අංක 3466 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 60 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 50, 51 සහ 53, නැගෙනහිරට : ලොට් 53, 54 සහ 59, දකුණට : ලොට් 59 සහ 61 සහ බස්නාහිරට : ලොට් 51 සහ 50 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0 R:0 P:7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එහි අංක 3466 දරන පිඹුරට අනුවය.

අංක 3466 දරන පිඹුරේ නිරූපිත ලොට් 13, 26, 32, 33, 40, 47, 49, 61 සහ 63 වශයෙන් ලකුණුකොට ඇති සියලුම මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒවා යටින් ද ඇතුළු වෙනත් පොදු අයිතීන් ද සමගය.

එකී පිඹුරු අංක. 3466 හි නිරූපිත ලොට් 60 වශයෙන් ලකුණු කොට ඇති එකී ඉඩම් කොටස, බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත පී. පෙරේරා යන අය විසින් සාදන ලද 2007 ඔක්තෝබර් මස 17 දාතම හා අංක 2252 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි දැනට පවත්නා මායිම් මත නැවත මිනුමක් සහ උපබෙදුමක් වන අතර එය වෙනත් අයුරකින් රජයේ මිනින්දෝරු එච්. ඒ. ඩී. එස්. ප්‍රේමසිරි යන අය විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 14 දාතම හා එකී අංක Co. 8098 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 8, 9, 10 සහ 11 සහ බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2006.08.23 දාතමින් පිටසන් කරන ලද හා එල්. පී. ඒ. ශාන්ත පෙරේරා විසින් සාදන ලද 2000.11.08 දාතම හා අංක 1366 හි ලොට් 1 හි නැවත මිනුමක්, උපබෙදුමක් සහ ඒකාබද්ධයක් ද වන අතර (සර්වේයර් ජනරාල් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් සහ දේපළ), පී. වඩුගෙදර යන අය විසින් සාදන ලද 1981 අගෝස්තු මස 20 දාතම හා Co. 5530 දරන P. පිඹුරේ නිරූපිත ලොට් 1 සිට 28 දක්වා) එය පහත සඳහන් පරිදිය.

